දැරණියගල කොට්ඨාසය

**e-නැණපියස වැඩ සටහන**

**දියමන්ති ව්‍යාපෘතිය**

**සාමාන්‍ය පාඩම් - 12**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම /ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | II | 7.2.1.සෙංකඩගලපුර ශ්‍රී දළදා වරුණ |

**ඉගෙනුම් අත්වැල**

**මහනුවර ශ්‍රී දළදා මාළිගාව**






- ශ්‍රී දළදා මාළිගාව ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාවගේ මුදුන් මල් කඩක් ලෙසට හැඳින්විය හැකිය.
- මෙය දෙවන විමලධර්මසූරිය රජතුමා විසින් ගොඩනංවා ඇති බව සඳහන් වේ(ක්‍රි.ව.1687-1707).
- දළදා මාළිගාවට අයත් ගොඩනැඟිලි සංකීර්ණය වාස්තු විද්‍යාත්මක නිර්මාණ රැසකින් යුක්ත ය.
- ඒවා අතර **දළදා මැදුර,මඟුල් මඩුව,පත්තිරිප්පුව,උල්පැන්ගෙය, දියතිලක මණ්ඩපය, මුලාදැනි මන්දිරය** ආදිය වේ.
- මෙම ආගමික සංකීර්ණයේ ඇති සුවිශේෂීම ගෘහ නිර්මාණ අංගය වන්නේ පත්තිරිප්පුව යි.
- මෙම ගොඩනැඟිල්ල අටපට්ටම් හැඩයෙන් යුක්ත ය.
- ගොඩනැගිල්ල වටා පේශාවන් දැක්වෙන අතර කවුලු,කුළුණු හා ගරාදි වැටවල් ක්‍රමානුකූලව නිර්මාණය කර ඇත.
- පත්තිරිප්පුව නිර්මාණයේ ගෞරවය හිමිවන්නේ දේවේන්ද්‍ර මූලාචාරීන්ට ය.
- ශ්‍රී දළදා මැදුරේ මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම් රැසක් දක්නට ලැබෙන අතර ලියකම්, මල්කම්, කල්පිත රූප වැදගත් වේ.
- මහනුවර යුගයේ දක්නට ලැබෙන හොඳම සඳකඩ පහණ දළදා මාළිගාවෙන් හමුවේ.
- ත්‍රිකෝණාකාර හැඩයක් ගන්නා මෙම සඳකඩපහණ මාධ්‍යයේ මදක් උස් වූ පද්මයක් හා දෙපස මල් ලියකම් දැකිය හැකි ය.

**ක්‍රියාකාරකම**

1. දළදා මාළිගාව ඉදි කර ඇත්තේ කුමන රජුගේ කාලයේ දී ද?
2. දළදා මාළිගාවේ දක්නට ලැබෙන ප්‍රධාන වාස්තු විද්‍යාත්මක නිර්මාණ මොනවාද?
3. පත්තිරිප්පුව නිර්මාණය කර ඇත්තේ කවුද?
4. දළදා මාළිගාවෙන් හමුවන සඳකඩ පහණේ ඇති විශේෂත්වය කුමක්ද?

**පැවරුම.- මහනුවර ශ්‍රී දළදා මාළිගාව ආශ්‍රිත වාස්තු විද්‍යාත්මක හා කලාත්මක අංග පිළිබඳ වැඩිදුර තොරතුරු එකතු කරන්න**